# සරණාගතයන් ලෙස පිළිගැනීම සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අන්තර්ජාතික සිසුන් සඳහා

2018 පෙබරවාරි

අධිකරණ අමාත්‍යාංශය සහ ආගමන දෙපාර්තුමේන්තුව

අධිකරණ අමාත්‍යාංශය මේ වන තෙක්, නිත්‍යානුකූලව ජපානයේ රැඳී සිටින විදේශිකයින් විසින් සරණාගතයන් ලෙස පිළිගැනීම සඳහා වූ ඉල්ලීමක් සිදුකල විට, ඉල්ලුම් කල දින සිට 6 මසක් ගෙවීගිය පසු, ප්‍රතිපත්තියක් ලෙස රැකියා අවසරය ලබාදෙන ස්ථාවරයේ සිටියේය. නමුත්, මෙම වසරේ ජනවාරි මස 15 දින, සරණාගතයින් ලෙස පිළිගැනීමේ ක්‍රියාවලිය තුල අයදුම්කරුට ලබාදෙන්නා වූ ජපානයේ රැඳී සිටීමේ සුදුසුකමේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කරන ලදී.

**නියමාකාරයෙන් පැවසුවහොත්, අන්තර්ජාතික සිසුන් සම්බන්ධයෙන් ගත් කල, පාසලෙන් නෙරපාහල පසු හෝ අධ්‍යාපන ආයතනයෙන් ඉගැනීම අවසන් කල පසු, සරණාගතයන් ලෙස පිළිගැනීම සඳහා වූ ඉල්ලීමක් කල අවස්ථාවේදී, ඉල්ලීම කල දින සිට 6 මසක් ගතවුවද, ප්‍රතිපත්තියක් ලෙස රැකියා අවසරය ලබා නොදෙන ස්ථාවරයට පැමිණියේය.**

(සටහන 1) අධ්‍යාපනය ලබමින් සිටියදී සරණාගතයන් ලෙස පිළිගැනීම සඳහා ඉල්ලීම් කල හැකිය.

(සටහන 2) සරණාගත සම්මුතියට අනුව සරණාගතයෙකු වීමේ හැකියාව වැඩිනම්, එසේත් නැතහොත් එම තැනැත්තාගේ රටේ තත්වය වැනි දෑ සලකා බලා, මානුෂීය අවධානයේ අවශ්‍යතාවය වැඩිනම්, මෙම අවස්ථාවන්ට පමණක් සීමාකර, රැකියා අවසරය ලබා දෙනු ලැබේ.

ඊට අමතරව, පාසල් අධ්‍යාපන ආයතනයේ දී නීති සහ රෙගුලාසි උල්ලංඝනය වන බව ඔබට හැඟෙන්නේ නම්, කරුණාකර ළඟම ඇති ප්‍රාදේශීය ආගමන දෙපාර්තුමේන්තු කාර්යාලයෙන් උපදෙස් ලබාගන්න.